සමාජ මාධ්‍ය භාවිතා කරමින් දැන්වීම් පළ කර, සහකරුවන් සොයන සමරිසි පුද්ගලයන් ප්‍රයෝගයෙන් ගෙන්වාගෙන, ඔවුන්ට පහර දී වීඩියෝගත කර, බියගන්වා කප්පම් මුදල් ලබාගත් බව කියන කල්ලියක පිරිසක් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන්, දිනමිණ සහ අරුණ පුවත්පත්, සිරස්තල දක්වා තිබුණේ මේ අයුරිනි.

දිනමිණ - "සමරිසි ක්‍රියාවන්ට එන්න කියා නිරුවත් කර පහර දී වීඩියෝ කරලා, බිය ගන්වා කප්පම් ගත් 4ක් කොටු"

අරුණ - "ඇප් එකෙන් මල් පෙන්නා සමනලුන්ගේ තටු කපන කල්ලිය ඇල්ලූ මෙහෙයුම"

1) මෙම පුවත් ලිපි දෙකේම අන්තර්ගතය, සමරිසි ලිංගික දිශානතිය සහිත පුද්ගලයන්ව ගර්හාවට හෝ කොන් කිරීමට පත් කරනා ආකාරයෙන් ලියවී නොතිබුණත්, මෙම ලිපි දෙකේ සිරස්තල සසඳා බලන විට, වඩාත් යෝග්‍ය යැයි ඔබ තෝරාගන්නා සිරස්තලය කුමක්ද?

2) සමරිසි පුද්ගලයන්ව "සමනලුන්" ලෙසින් හැඳින්වීම කෙතරම් යෝග්‍ය වේ ද? එය සමකාමී ලිංගික දිශානතියක් සහිත පුද්ගලයන් කෙරෙහි වෙනස් ලෙසින් සැලකීමේ ආකල්පයක් සමාජගත වීමට හේතුවක් නොවනු ඇතිද?